චක්‍රලේඛ අංක: 05/2013


RG/MBD/1/2012

/ අංකය
உது இல.
our No.

දුරකථන අංක
தொலைபேசி இல.
Telephone Nos. 2889488 / 2889489

ෆැක්ස් අංකය
தொலைநகல்
Fax No. 2889491

ඊ මේල්
மின்னஞ்சல்
E-mail info@rgd.gov.lk / rg@rgd.gov.lk

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
பதிவாளர் நாயகத் திணைக்களம்
REGISTRAR-GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

වෙබ් අඩවිය
இணையத்தளம்
Web site www.rgd.gov.lk

තැ. පෙ. අංකය
த. பெ. இல.
P. O. Box No. 565

234/A3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

234/A3,
டென்சில் கொப்பேகடுவ மாவத்தை,
பத்தரமுல்லை.

234/A3,
Denzil Kobbakaduwa Mawatha,
Battaramulla.


දිනය / திகதி / Date: 2013/02/19

සියළුම විවාහ (සාමාන්‍ය/උඩරට/මුස්ලිම්) රෙජිස්ට්‍රාර්වරුන් වෙත,

## විවාහ ලියාපදිංචි කිරීමේදී ගාස්තු අයකිරීම

සාමාන්‍ය විවාහ ආඥා පණත, උඩරට විවාහ ආඥා පණත සහ මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත යටතේ දිවයිනේ ලියාපදිංචි කරනු ලබන විවාහ සඳහා මහජනයාගෙන් අධික ගාස්තු අයකරන බව මා වෙත වාර්තාවී ඇත. මෙවැනි කටයුතු නිසා ගරු සේවයක් වශයෙන් සැලකෙන ග්‍රාමීය රෙජිස්ට්‍රාර් සේවය මෙන්ම පොදුවේ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවද අපකීර්තියට පත්වේ. එබැවින්, විවාහ ලියාපදිංචි කිරීම සඳහා මහජනයා විසින් ගෙවිය යුතු ගාස්තු පිළිබඳ නිසි දැනුමක් ඇති කිරීමත් එම ගාස්තු නියමිත ප්‍රමාණයෙන් අයකර ගැනීමත් සඳහා රෙජිස්ට්‍රාර්වරුන් යොමු කරවීමත් කාලීන අවශ්‍යතාවයක් බව පෙනී ගොස් ඇත.

02. ඒ අනුව සෑම විවාහ රෙජිස්ට්‍රාර්වරයකුම තමන් ලියාපදිංචි කරනු ලබන විවාහ සඳහා ලබා ගන්නා ලද ගාස්තු පිළිබඳව සාරාංශයක් මේ සමග අමුණා ඇති ආකෘතිය අනුව සම්පූර්ණකර මාසිකව දෙවන පිටපත් සමග දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයට ඉදිරිපත් කිරීමට කටයුතු කළයුතු වේ.

03. විශේෂ බලපත්‍ර මත විවාහ සිදු කිරීමට අයදුම් කිරීමේදී, එම බලපත්‍ර ගාස්තු ළඟම පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට හෝ රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ ලංකා බැංකුවේ පිටකොටුව ශාඛාවේ අංක 7041650 දරණ ගිණුමට හෝ බැර කළ හැක. විවාහ ලියාපදිංචි කිරීමේදී රජයට ගෙවි යුතු ගාස්තු රෙජිස්ට්‍රාර්වරයා විසින්ම ලබා ගැනීමේදී එම මුදල් එක් දිනකට වඩා රෙජිස්ට්‍රාර්වරයා භාරයේ තබා ගැනීමෙන් වළකින ලෙසද උපදෙස් දෙමි.

04. විවාහ ලියාපදිංචි කිරීමේදී පාර්ශවකරුවන් විසින් ගෙවිය යුතු ගාස්තු පිළිබඳ දැන්වීමක්ද මේ සමග අමුණා එවමි. එම දැන්වීම ඔබගේ පහසුවට දැනගැනීම සඳහා සහ මහජනයාගේ අවධානය සඳහා ඔබගේ කාර්යාලීය දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරන ලෙසද මෙයින් උපදෙස් දෙමි.

05. මහජනයාගෙන් නිත්‍යානුකූල නොවන පරිදි මුදල් අයකර ගැනීම් පිළිබඳව මා වෙත පැමිණිලි ලැබුනොත් ඒ සම්බන්ධයෙන් දැඩි විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බවද කාරුණිකව දන්වමි.

රෙජිස්ට්‍රාර් ජනරාල්
ඩී. එම්. ගුණසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත් : 1) සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් - දැ.ගැ.ස.
2) සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් - අ.ක.ස.
3) සියලුම ඉඩම් රෙජිස්ට්‍රාර් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් - දැ.ගැ.ස.
4) කලාප භාර සියලුම සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - දැ.ගැ.ස.

சுற்றுநிருபம் இல.05/2013 (தமிழ் மொழிப்பெயர்ப்பு)


මගේ අංකය / எனது இல. / My No. — RG/MBD/1/2012

ඔබේ අංකය / உமது இல / Your No.

දුරකතන අංක / தொலைபேசி இல / Telephone Nos — 2889488, 2889489

ෆැක්ස් අංක / தொலை நகல் / Fax No — 2889491, 2889492

ඊ-මේල් / மின்னஞ்சல் / E-mail — rgd@sltnet.lk


**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**
பதிவாளர் நாயகம் திணைக்களம்
REGISTRAR GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE


වෙබ් අඩවිය / இணைய தளம் / Web Site — www.rgd.gov.lk

තැ.පෙ.අංකය. / த.பெ.இல. / P.O.Box No.

234/ඒ3
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත
බත්තරමුල්ල.
234/ஏ3 டென்சில் கொப்பேகடுவ
மாவத்தை. பத்தரமுல்ல
234/A3
Densil kobbakaduwa Mawatha
Battaramulla


දිනය/திகத/Date 2013.02.19....

அனைத்து விவாக (பொது/கண்டிய/முஸ்லிம்) பதிவாளர்கட்கு.

<u>விவாகம் பதிவு செய்தற் கட்டண அறவீடு</u>

பொது விவாகக் கட்டளைச் சட்டம், கண்டிய விவாக கட்டளைச் சட்டம் மற்றும் முஸ்லிம் விவாக மற்றும் விவாகரத்துச் சட்டத்தின் கீழ் தீவினுள் பதிவு செய்யப்படும் விவாகத்திற்காக மக்களிடம் அதிக பணம் அறவிடப்படுவதாக எனக்கு அறிக்கையிடப்பட்டுள்ளது. இவ்வாறான நடவடிக்கையினால் கௌரவ சேவையாக கருதப்படும் கிராமிய விவாகப் பதிவாளர்களின் சேவையினைப் போன்றே பதிவாளர் நாயகம் திணைக்களமும் அபகீர்த்திக்கு உள்ளாகும். ஆகையினால், விவாகத்தினை பதிவு செய்வதற்காக மக்கள் மூலம் செலுத்தப்படும் பணம் பற்றிய உரிய அறிவூட்டுவதற்காகவும் அப்பணத்தினை உரிய அளவில் அறவிடுவதற்காகவும் பதிவாளர்களை ஈடுபடுத்துவது காலத்தின் தேவையாகும் என இனங்காணப்பட்டுள்ளது.

02. அதன் பிரகாரம் அனைத்து விவாக பதிவாளர்களும் தான் பதிவு செய்யும் விவாகத்திற்காக பெற்றுக்கொள்ளும் பணம் பற்றிய சாராம்சத்தினை இதனுடன் இணைத்துள்ள படிவத்திற்கிணங்க பூரணப்படுத்தி மாதாந்தம் இரண்டாம் பிரதிகளுடன் மாவட்ட பதிவகத்திற்கு சமர்ப்பிப்பதற்கு நடவடிக்கை எடுத்தல் வேண்டும்.

03. விசேட அனுமதிப்பத்திரத்தின் மீது விவாகம் நிகழ்த்தப்படுவதற்கு விண்ணப்பிக்கும் பொழுது, அவ் அனுமதிப்பத்திர கட்டணத்தினை அருகிலுள்ள பிரதேச செயலகத்திற்கு அல்லது பதிவாளர் நாயகத்தின் இலங்கை வங்கியின் புறக்கோட்டை கிளைக்கு 7041650 இலக்கமுடைய கணக்கிற்கு வரவு வைத்தல் வேண்டும். விவாகம் பதிவு செய்யும் பொழுது அரசாங்கத்திற்கு செலுத்தப்பட வேண்டிய கட்டணம் பதிவாளர் மூலம் பெற்றுக்கொள்ளும் பொழுது அப்பணம் ஒரு நாளை விட அதிகம் பதிவாளர் வசம் வைத்துக்கொள்ளுதலை தவிர்க்குமாறு ஆலோசனை வழங்குகின்றேன்

04. விவாகம் பதிவு செய்யும் பொழுது திறத்தார் மூலம் செலுத்தப்படவேண்டிய பணம் பற்றிய அறிவித்தலினை இத்துடன் அனுப்புகின்றேன். அவ்வறிவித்தலினை தாங்கள் இலகுவாக அறிந்துக்கொள்வதற்காகவும் மற்றும் பொது மக்களின் அவதானத்திற்காக தங்களது அறிவித்தல் பலகையில் காட்சிப்படுத்துவதற்கு நடவடிக்கை எடுக்குமாறு இத்தால் ஆலோசனை வழங்குகின்றேன்.

05. மக்களிடம் சட்டரீதியானது அல்லாத விதத்தில் பணம் அறவிடப்படுதல் பற்றி எனக்கு முறையீடு கிடைக்கப்பெறின் அது சம்பந்தமாக கடுமையான ஒழுக்காற்று நடைமுறையினை எடுப்பதற்கு நடவடிக்கை மேற்கொள்ளப்படும் என தாழ்மையுடன் அறிவிக்கின்றேன்.

ஒப்பம்:- ஈ.எம். குணசேகர,

பதிவாளர் நாயகம்

பிரதிகள்:

1. அனைத்து மாவட்ட செயலாளர்கட்கும் - தகவலுக்காக.
2. அனைத்து பிரதேச செயலாளர்கட்கும் -தேவையான நடவடிக்கைக்காக.
3. அனைத்து காணி மற்றும் மேலதிக மாவட்ட பதிவாளர்கட்கு - தகவலுக்காக.
4. வலய பொறுப்பு அனைத்து உதவி பதிவாளர்கட்கும் - தகவலுக்காக.

............................................................කොට්ඨාසයේ විවාහ රෙජිස්ට්‍රාර් ............................................................මයා/මිය විසින්

20 ......... .................... මාසය තුළ සාමාන්‍ය /උඩරට විවාහ ලියාපදිංචි කිරීමේදී අයකර ගත් ගාස්තුවල සාරාංශය

| විවාහ ලේඛනයේ අංකය සහ දිනය | විවාහ දැන්වීම් අංකය සහ දිනය | ගෙවූ ගාස්තු ප්‍රමාණය (රු.) | | | | | | ගාස්තුවල එකතුව (රු.) | | ගෙවූ ගාස්තුවල මුළු එකතුව (රු.) | ගාස්තු ගෙවූ මනාලිය/ මනාලයාගේ අත්සන |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | විවාහ දැන්වීමට | විශේෂ බලපත්‍රයට (රජයට) | විවාහ දැන්වීමේ පිටපතට (රජයට ) | ගෘහ බලපත්‍රයට (රජයට) | රෙජිස්ට්‍රාර්ගේ සහතිකයට | විවාහය ලියාපදිංචි කිරීමට | රජයට | විවාහ රෙජිස්ට්‍රාර්වරයාට | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |

විවාහ රෙජිස්ට්‍රාර්ගේ අත්සන හා නිල මුද්‍රාව

............................................................කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ............................................................මයා විසින්

20 ......... .................... මාසය තුළ විවාහ ලියාපදිංචි කිරීමේදී අය කර ගත් ගාස්තුවල සාරාංශය

| විවාහ ලේඛනයේ අංකය සහ දිනය | ගෙවූ ගාස්තුව (රු.) | | | | රජයට ගෙවූ මුළු ගාස්තුව (රු.) | ගෙවූ ගාස්තුවල මුළු එකතුව (රු.) | ගාස්තු ගෙවූ මනාලියගේ වාලි/ මනාලයාගේ අත්සන |
|---|---|---|---|---|---|---|---|
| | 18(1) වගන්තිය යටතේ මනාලයාගේ ප්‍රකාශයට (රජයට) | 18(1) වගන්තිය යටතේ මනාලියගේ වාලිගේ ප්‍රකාශයට (රජයට) | තම බල ප්‍රදේශයෙන් පිටත විවාහ ලියාපදිංචි කිරීමේ බලපත්‍රයක් ලබාගැනීමට | විවාහය ලියාපදිංචි කිරීමට | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

රෙජිස්ට්‍රාර්ගේ අත්සන හා නිල මුද්‍රාව

# 2013 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන විවාහ(සාමාන්‍ය/ උඩරට) ලියාපදිංචි කිරීමේ ගාස්තු

1. රෙජිස්ට්‍රාර් කාර්යාලයේදී සම්පූර්ණ දින 12 කට පෙර විවාහ දැන්වීම භාරදී විවාහය ලියාපදිංචි කිරීම

| අනු අංකය | ගාස්තු ගෙවන කාරණය | ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණය (රු) | |
|---|---|---|---|
| | | රජයට | රෙජිස්ට්‍රාර්වරයාට |
| 1 | විවාහ දැන්වීම ඇතුළත් කිරීමට | - | 100.00 |
| 2 | විවාහ දැන්වීම මත රෙජිස්ට්‍රාර්වරයාගේ සහතිකය නිකුත් කිරීමට | - | 100.00 |
| 3 | විවාහය ලියාපදිංචි කිරීමට | - | 750.00 |
| | එකතුව | - | **950.00** |

2. රෙජිස්ට්‍රාර් කාර්යාලයේදී විශේෂ බලපත්‍රයක් මත විවාහය ලියාපදිංචි කිරීම

| අනු අංකය | ගාස්තු ගෙවන කාරණය | ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණය (රු) | |
|---|---|---|---|
| | | රජයට | රෙජිස්ට්‍රාර්වරයාට |
| 1 | විවාහ දැන්වීම ඇතුළත් කිරීමට | - | 100.00 |
| 2 | විවාහ දැන්වීම් පිටපතට | 100.00 | - |
| 3 | විශේෂ බලපත්‍රයට | 100.00 | - |
| 4 | විවාහ දැන්වීම මත රෙජිස්ට්‍රාර්වරයාගේ සහතිකය නිකුත් කිරීමට | - | 100.00 |
| 5 | විවාහය ලියාපදිංචි කිරීමට | - | 750.00 |
| 6 | එකතුව | 200.00 | 950.00 |
| 7 | විවාහ පාර්ශ්වකරුවන් ගෙවිය යුතු මුළු ගාස්තුව | **1150.00** | |

3. රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් පිටතදී සම්පූර්ණ දින 12 කට පෙර විවාහ දැන්වීම් භාරදී විවාහය ලියාපදිංචි කිරීම (රෙජිස්ට්‍රාර්වරයාට ප්‍රවාහන පහසුකම් සැපයිය යුතුය)

| අනු අංකය | ගාස්තු ගෙවන කාරණය | ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණය (රු) | |
|---|---|---|---|
| | | රජයට | රෙජිස්ට්‍රාර්වරයාට |
| 1 | විවාහ දැන්වීම ඇතුළත් කිරීමට | - | 100.00 |
| 2 | ගෘහ බලපත්‍රයට | 3500.00 | - |
| 2 | විවාහ දැන්වීම මත රෙජිස්ට්‍රාර්වරයාගේ සහතිකය නිකුත් කිරීමට | - | 100.00 |
| 3 | විවාහය ලියාපදිංචි කිරීමට | - | 1500.00 |
| 4 | එකතුව | 3500.00 | 1700.00 |
| 5 | විවාහ පාර්ශ්වකරුවන් ගෙවිය යුතු මුළු ගාස්තුව | **5200.00** | |

4. රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් පිටතදී විශේෂ බලපත්‍රයක් මත විවාහය ලියාපදිංචි කිරීම (රෙජිස්ට්‍රාර්වරයාට ප්‍රවාහන පහසුකම් සැපයිය යුතුය)

| අනු අංකය | ගාස්තු ගෙවන කාරණය | ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණය(රු) | |
|---|---|---|---|
| | | රජයට | රෙජිස්ට්‍රාර්වරයාට |
| 1 | විවාහ දැන්වීම ඇතුළත් කිරීමට | - | 100.00 |
| 2 | විවාහ දැන්වීම් පිටපතට | 100.00 | - |
| 3 | විශේෂ බලපත්‍රයට | 100.00 | - |
| 4 | ගෘහ බලපත්‍රයට | 3500.00 | |
| 5 | විවාහ දැන්වීම මත රෙජිස්ට්‍රාර්වරයාගේ සහතිකය නිකුත් කිරීමට | - | 100.00 |
| 6 | විවාහය ලියාපදිංචි කිරීමට | - | 1500.00 |
| 7 | එකතුව | 3700.00 | 1700.00 |
| 8 | විවාහ පාර්ශ්වකරුවන් ගෙවිය යුතු මුළු ගාස්තුව | **5400.00** | |

# 2013 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන
# මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ ගාස්තු

1. රෙජිස්ට්‍රාර් කොට්ඨාසය ඇතුළත විවාහය ලියාපදිංචි කිරීම

| අනු අංකය | ගාස්තු ගෙවන කාරණය | ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණය (රු) | |
|---|---|---|---|
| | | රජයට | රෙජිස්ට්‍රාර්වරයාට |
| 1 | මනාලයාගේ ප්‍රකාශයට | 100.00 | - |
| 2 | මනාලියගේ වාලිගේ ප්‍රකාශයට | 100.00 | - |
| 3 | විවාහය ලියාපදිංචි කිරීමට | - | 1500.00 |
| 4 | එකතුව | 200.00 | 1500.00 |
| | විවාහ පාර්ශ්වකරුවන් ගෙවිය යුතු මුළු ගාස්තුව | **1700.00** | |

2. රෙජිස්ට්‍රාර් කොට්ඨාසයෙන් පිටත විවාහය ලියාපදිංචි කිරීම

| අනු අංකය | ගාස්තු ගෙවන කාරණය | ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණය (රු) | |
|---|---|---|---|
| | | රජයට | රෙජිස්ට්‍රාර්වරයාට |
| 1 | මනාලයාගේ ප්‍රකාශයට | 100.00 | - |
| 2 | මනාලියගේ වාලිගේ ප්‍රකාශයට | 100.00 | - |
| 3 | විශේෂ බලපත්‍රයට | 3500.00 | - |
| 4 | විවාහය ලියාපදිංචි කිරීමට | - | 1500.00 |
| 5 | එකතුව | 3700.00 | 1500.00 |
| | විවාහ පාර්ශ්වකරුවන් ගෙවිය යුතු මුළු ගාස්තුව | **5200.00** | |